

කෙස් කළඹ සකසා ගැනීමේදී උඩරට ඔසරියට ගැලපෙන අයුරින් පිටුපසට වන්නට ගෙඩියක් ආකාරයට සකසා තිබේ. සාම්ප්‍රදායික ක්‍රමයට තුන් තැල්ල හා ඉරහඳ භාවිතා කර ඇත. හිස සැරසිල්ල සාරියට ගැලපෙන ලෙස රන් හා කහ පැහැයෙන් යොදා ගෙන ඇත. මල් කළඹ ගැන විශේෂයෙන් කථා කල හැක. නව නිර්මාණයකට අනුව සාරියට ගැලපෙන ලෙස මල් හා කොළ වර්ග යොදා ඇත. මනාලියගේ ශරීරයේ ස්වභාවයට ගැලපෙන පරිදි සකසා තිබේ. සමස්ථයක් ලෙස ගැනීමේ දී ශරීරයේ වර්ණය පැහැයට ගැලපෙන ලෙස නිර්මාණශීලී ආකාරයට හැඩ ගැන්වූ උඩරට මනාලියකි.

**නිරූපණය:- මිනොලි /සුරම්මි**

## දෙවෙනි ගමනට නව විලාසිතාවක්...

වෙළඳපොලෙන් මිලදී ගත් සාරියෙන් නව නිර්මාණයක් ලෙස සකසා ඇත. රන් පැහැයෙන් නිර්මාණය වූ විශාල යට සායක් හා හැට්ටයක් යොදා හැඩ ගන්වා ඇත. හිසකෙස් විලාසිතාව ගැන කථා කිරීමේදී ඇගේ ස්භාවික කෙස් කළඹ රැලි ලෙස සකසා ඇත. බටහිර විලාසිතාවක් නිර්මාණය කිරීමට මෙම හිසකෙස් විලාසිතාව උපයෝගී කර ගෙන ඇත. හිස සැරසිල්ල සඳහා රන් පැහැති කොළ විශේෂයකට රතුපාට ගල් අල්ලාගෙන ඇත. ආභරණ පැලැන්දවීමේදී ඇඳුමේ පැහැයට ගැලපෙන පරිදි රන් පාට ආභරණ යොදා තිබේ. Make - up යොදා ගැනීමේදී සාරියේ වර්ණයට ගැලපෙන ලෙස බටහිර පන්නයට සුදුසු ලෙස යොදා තිබේ. ඇස් ගැන කථා කිරීමේදී රන් හා රතු පැහැයද තොල් ආලේපන සඳහා රන් පැහැයද යොදා ගැනිණ.

Goinaway විලාසිතාවට ගැලපෙන ලෙස සැහැල්ලු මල් කළඹක් සකසා ඇත. එය රන් පැහැයෙන් යුත් මල් ඉත්තකි.

හැඩගැන්වීම :-
සඳාන , ජා ඇල
**ඉරේෂා මල්ලවආරච්චි**

